මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පර්යේෂණ වාක්කෝෂය
Encyclopaedic Dictionary of Humanities and Social Science Research
Faculty of Humanities and Social Sciences, University of Sri Jayewardenepura

# මාගර්ගත පයෙර්ෂණ

***Online Research***

අන්තජර්ාලය හරහා තොරතුරු ඒකරාශි කරන පයෙර්ෂණ ක්‍රමවේදය මාගර්ගත පයෙර්ෂණ ලෙස හැඳින්විය හැකි ය. සාම්ප්‍රදායික පයෙර්ෂණ ක්‍රමවලින් එහාට ගිය පහසුකම් රැසක් මෙම පයෙර්ෂණවල දැකගත හැකි ය. අන්තජර්ාලය ජාලයන් අතර ජාලයකි. අන්තජර්ාලය ආරම්භක යුගයේ ඇරඹි ඇමරිකාවේ උසස් පයෙර්ෂණ ව්‍යාපෘති ඒජන්සියේ (Advance Research Project Agency) ARPA Net ජාලය යොදා ගෙන ඒ යුගයේදීම විවිධ පයෙර්ෂණ සිදුකර ඇත. 1972 දී විද්‍යුත් තැපැල ආරම්භ කිරීමත් සමගින් 1986 සිට විද්‍යුත් තැපැල යොදාගෙන පයෙර්ෂණ සිදුකිරීම ඇරඹිණි. 1992 විශ්ව ව්‍යාප්ත ජාලය (World Wide Web) හඳුන්වාදීමත් සමඟ 1994 සිට වෙබ් අඩවි සමීක්ෂණ ආරම්භ කර ඇත (ලොකුමාන්නගේ, 2021). 1990 දශකයේ අග භාගය වන විට සමාජ මාධ්‍ය (social media) බිහිවීමත්, මාගර්ගත පයෙර්ෂණ සඳහා දායක වන මෘදුකාංග (Software) බිහිවීමත් නිසා මාගර්ගත පයෙර්ෂණ වඩාත් පහසු වී ඇත. Facebook, Whatsapp, Viber, Wechat, YouTube නාලිකා බ්ලොග් අඩවි, විද්‍යුත් පුවත්පත් (e-newspapers) මෙහිදී බෙහෙවින් යොදා ගැනේ. Typeform, HubSpot, Survey Monkey, Google forms වඩාත් පහසුවෙන් හා ඉක්මනින් දත්ත ඒකරාශිකරණයත්, දත්ත අධ්‍යයනය කිරීමත්, දත්ත ඉදිරිපත් කිරීමත් සිදුකළ හැක (Bruggen & Willems,2009). එසේම Google Form යනු බහුලව ඊට යොදාගන්නා යෙදවුමකි.

ප්‍රධාන වශයෙන් අන්තජර්ාලය යොදාගෙන මාගර්ගත ක්‍රමයට සිදුකළ හැකි පයෙර්ෂණ ක්‍රම 05ක් හඳුනාගත හැකි ය.

1. මාගර්ගත ඉලක්ක කණ්ඩායම් පයෙර්ෂණ (Online Focus Group Research)
දේශපාලන හා පාරිභෝගික පයෙර්ෂණ මීට උදාහරණ වේ. තෝරාගත්, සුදුසුකම් ඇති පිරිසක් හැමවිටම මෙම පයෙර්ෂණය සඳහා යොදාගනී. පයෙර්ෂකයාට ඉලක්කගත දත්ත දායකයින් පිළිබඳ මූලික අවබෝධයක් පවතී.

2.මාගර්ගත සම්මුඛ සාකච්ඡා (Online Interviews)
මාගර්ගත සම්මුඛ සාකච්ඡා සජීවි හා සජීවි නොවන ලෙස කොටස් දෙකකින් දැකිය හැකි ය. සජීවි සම්මුඛ සාකච්ඡා ස්කයිප් (Skype) වැනි වීඩියෝ තාක්ෂණ සහිත වෙබ් අඩවි යොදාගෙන, Zoom වැනි මාගර්ගත ඉගෙනුම් මාධ්‍ය යොදාගෙන, හෝ Whatsapp වැනි සමාජ මාධ්‍ය යොදාගෙන සිදුකළ හැකි ය.

3.මාගර්ගත ගුණාත්මක පයෙර්ෂණ (Online Qualitative Research)
අන්තජර්ාල බ්ලොග් අඩවි, ජංගම දුරකථන ඇප් භාවිත කර ගුණාත්මක පයෙර්ෂණ බහුලව සිදුවේ. කාලය, ශ්‍රමය, හා මුදල් ඉතිරි කරගනිමින් දත්ත රැස්කර ගැනීමට හැකිවීම වාසියකි.

මාගර්ගත පාඨ අධ්‍යයනය (Online Text Study)
අන්තජර්ාලය තුළ විවිධ පයෙර්ෂණ පත්‍රිකා, ඓතිහාසික ලිපි, වාතර්ා ආදිය දැකගත හැකි ය. එසේම විද්‍යුත් පුවත්පත් හා විද්‍යුත් සඟරා ආදිය ද දැකගත හැකි ය. අන්තජර්ාලය හරහා එම තොරතුරු බාගත කිරීමටත් (Download) අධ්‍යයනය කිරීමටත්, රූප, වගු, ප්‍රස්තාර උපුටා දැක්වීම් සහිතව ඉදිරිපත් කිරීමටත් පහසු ය. මුද්‍රිත පාඨ ඒකරාශි කරගන්නවාට වඩා ඉක්මනින් හා අඩු මුදලකින් අන්තජර්ාල පාඨ රැස්කරගත හැකිවීම ප්‍රධාන වාසියකි.

සමාජ මාධ්‍ය අධ්‍යයනය (Social Media Study)
වතර්මානයේ බහුලව යොදාගන්නා පයෙර්ෂණ ක්‍රමයක් වන අතර පුද්ගල කණ්ඩායම් පිළිබඳ, විවිධ ආයතන පිළිබඳ වඩා පහසුවෙන් අධ්‍යයනය කළ හැකි ය. සමාජ මාධ්‍යවල සංසරණය වන රූප, තොරතුරු, සබැඳි (Links), Imojis, Likes ආදිය දත්ත ලෙස යොදා ගැනීම දැකගත හැකි ය (Johns, Chen & Hall, 2004).
මේ ආකාරයේ මාගර්ගත පයෙර්ෂණ ක්‍රම උපයෝගී කර ගනිමින් සිදුකරන මාගර්ගත පයෙර්ෂණ රැසක් දැක ගත හැකි ය.

මාගර්ගත පයෙර්ෂණවල වාසි මෙන්ම අවාසි ද දැක ගත හැකි ය. වාසි ලෙස පයෙර්ෂණ සඳහා යන වියදම අඩුවීම, දත්ත දායකයන්ගේ ප්‍රතිචාර වැඩිවීම, දත්ත හුවමාරු කිරීමේ පහසුව, කාලය ඉතිරිවීම, තොරතුරු ලබා ගැනීමේ පහසුව, විශාල දත්ත දායකයන් පිරිසක් එකවර සම්බන්ධ කරගැනීමේ පහසුව, භෞතික සීමාවන් අතික්‍රමණය කිරීමේ පහසුව, දැකගත හැකි ය (Hine, 2005).

අවාසි ලෙස ඇතැම් සංකීණර් ගැටළු සාකච්ඡා කිරීමේ අපහසුව, රචනා චෞරය (Plagiarism), ග්‍රාමීය ප්‍රදේශවල ඇති සම්පත් හිඟකම, සහභාගිවන්නන්ගේ අනන්‍යතාව තහවුරු කර ගැනීමේ ගැටළු, තාක්ෂණික දැනුම ප්‍රමාණවත් නොවීම, පරිගණක හැකර් මෘදුකාංග හා වෛරස නිසා ඇතිවිය හැකි ගැටළු වැනි දෑ දැකගත හැකි ය. ඇතැම් විට වැරදි දත්තයන් ද අන්තජර්ාලයට එක්කොට පවතින බැවින් පයෙර්ෂකයා වැරදි නිගමනයන්ට එළඹීමට ද හැකියාව ඇත. (Schmidt, 1997).

අන්තජර්ාලය, පයෙර්ෂණ සඳහා වටිනා තෝතැන්නකි (Coomber, 1997). ඒ තුළින් සිදුවිය හැකි අක්‍රමිකතා අවබෝධ කර ගෙන පයෙර්ෂණ සිදු කිරීමෙන් වඩාත් ඵලදායි ප්‍රතිඵල ලබාගත හැකි ය. ප්‍රශ්නාවලි සැකසීමේදී සවිස්තරාත්මකව, උපදෙස් සහිතව ඉදිරිපත් කළ යුතු ය. දත්ත දායකයා තුළ අභිප්‍රේරණයක් ඇති වන ලෙස කෙටි පිළිතුරු හා වණර්ීය පිළිතුරු ඇතිව සැකසීම වඩා යෝග්‍ය වේ (Zhang, 2000). ඇතැම් විට ප්‍රතිචාර ඉක්මන් කිරීමට, සහභාගීත්ව වැඩි කර ගැනීමට ද විවිධ උපක්‍රම යෙදීමට සිදුවේ. එසේම මාගර්ගත පයෙර්ෂණ ආචාර ධමර් පිළිබඳ අවබෝධය ද ඉතා වැදගත් වේ.

*අමිල ලොකුමාන්නගේ*

## මූලාශ්‍රය නාමාවලිය

ලොකුමාන්නගේ, ඒ. (2021). මාධ්‍ය අධ්‍යයන ප්‍රවේශය. කොළඹ 10: ගොඩගේ ප්‍රකාශන.

Bruggen, E. and Willems, P. (2009). A critical comparison of offline focus groups, online focus groups and e-Delphi. International Journal of Market Research, 51 (3), pp.363–381.

Coomber, R. (1997). Using the Internet for survey research. Sociological Research Online, 2(2), pp.14-23.

Hine, C. (2005). Virtual methods: Issues in social research on the Internet. Oxford: Berg.

Johns, M. D.,Chen, S.L. and Hall, G.J. (2004). Online Social Research: methods, issues & ethics. New York: Peter Lang.

Copyright © 2023 Center for Digital Education and Professional Development, Faculty of Humanities and Social Sciences, University of Sri Jayewardenepura, Sri Lanka. All Rights Reserved.

Powered By CDEPD.

v.1.2.6